# 6 සභාවෙන් අවසරයි



“ආයුබෝවන්! අද අපේ ළමා සමිතිය රැස් වෙන දවස. හැමෝම සූදානම් වෙලා ආවා නේ ද?” ගුරුතුමිය ඇහුවා.

“ඔව්” කවුරුත් එක හඬින් පිළිතුරු දුන්නා.

හැමෝම නැගිටලා ආගම සිහි කළා.

''මුලින් ම මනුකගේ කතාවෙන් අපි සමිතියේ වැඩ පටන් ගනිමු'' ගුරුතුමිය කිවුවා.

“ආයුබෝවන්, සභාවෙන් අවසරයි!”

“පොත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ.”

“අද මං කතා කරන්නේ පොත් කියවීමේ අගය ගැන. අපි අපේ විවේකය ගත කරන්න නොයෙක් දේ කරනවා. පොත් කියවීමෙන් අපට ඒ කාලය සතුටින්, විනෝදයෙන්, සැහැල්ලුවෙන් ගත කරන්න පුළුවන්. කවි, ගීත, කතන්දර පොත් කියවලා දැනුම ලබන්නත් පුළුවන්. මගේ විනෝදාංශය පොත් කියවීම.

මම පාසලේ පුස්තකාලයෙන් පොත් අරගෙන කියවනවා. මගේ උපන්දිනේටත් මට පොතක් ලැබෙනවා. ලස්සන පින්තූර, චිත්‍ර වගේ ම අලුත් තොරතුරු ඒ පොත්වල තියෙනවා. පොත් කියවද්දි පොතේ තියෙන දේවල් හිතේ මැවෙනවා. තව තවත් පොත් කියවන්න ආසා හිතෙනවා. ඒ වගේ ලියන්න ඇත්නම් කියා මටත් හිතෙනවා.

අපි හැමෝම පොත් කියවීමට පුරුදු වෙමු.
මට සවන් දුන්නාට හැම දෙනාට ම ස්තුතියි.”

මනුකගේ කතාවට කවුරුත් සතුටින් අත්පොළසන් දුන්නා.



ඊළඟට සඳුනිගෙන් කවියක්.

"සභාවෙන් අවසරයි!

මම සභාවට ඉදිරිපත් කරන්නෙ හැමෝම දන්න පුංචි කවියක්.

ගුරු සිත නොරිදවා<br>
වේලාව නොවරදවා<br>
බැති පෙම් උපදවා<br>
අකුරු උගනී කුමරු සොඳවා

අපි හොඳින් ඉගෙන ගෙන යහපත් පුරවැසියන් වෙමු. අසා සිටි ඔබ සැමට ස්තුතියි! "



ඊළඟ වාරය තරණිගෙ. තරණි ලස්සන නාට්‍ය ගීතයක් ගායනා කළා.



ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ රඹුටන් ජම්බු ඉදිලා
අද හැමතැන හරි හැඩයි //

තරණි ඒ ගීතයට නැටුමකුත් ඉදිරිපත් කළා. හැමෝම තාලයට අත්පුඩි ගැසුවා.

නොදැනී ම කාලය ගත වුණා. කතාවට දක්ෂ අය කතා කළා. ගායනයට දක්ෂ අය කවි, ගීත ගායනා කළා. සභාවේ හැම දෙනා ම සතුටු වුණා.

"අද සමිතියේ වැඩ ඉතා ම සාර්ථකයි." ගුරුතුමිය ළමයින්ගේ දක්ෂතා අගය කළා. සභාවෙ වැඩ අවසන් වුණා.

හැමෝම හිටියේ හරි ම සතුටින්.

"ඊළඟ දවසේ මාත් සින්දුවක් කියනවා." යසිරු කිවුවා.